

# ස්වර්ණමය

# යුගයක

# අරුණෝදය

BKT 0129
26/08/2023

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# ස්වර්ණමය යුගයක අරුණෝදය

'මම කැප වෙලා
ඉන්නේ
මේ රටේ
අහිංසක ජනතාවගේ
දෙනෙත් තුළ
නගින
දුක් කඳුළු
පිසදමන්නට මිස
කිහිප දෙනෙකුගේ
කඳුළු පිස දමන්නට
නොවේ'

(signature)

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය



1988 ක්වූ දෙසැම්බර් මස 30 වැනිදින
කොළඹ - සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී
අතිගරු ජනාධිපති ආර්. ප්‍රේමදාස මැතිතුමා කළ කථාව

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

මාස දෙකක් ඇතුළත මහා සම්මේලන දෙකක් අපට පවත්වන්න පුළුවන් වුණා. දස දහස් සංඛ්‍යාත අපේ නියෝජිතයින් ලංකාවේ අට කොනින්ම අද මේ වාර්ෂික මහා සම්මේලනයට රැස්වෙලා ඉන්නව.

ප්‍රථමයෙන්ම දුක් ගැහැට විඳගෙන මේ විධියට අපේ පක්ෂය ශක්තිමත් කරන්නට පැමිණි නමුත්නාත්සේලාට අපේ ගෞරවය මේ අවස්ථාවේ දී පිරිනමනව. නමුත්නාත්සේලාට මතක ඇති ඔක්තෝබර් මාසෙ නමුත්නාත්සේලා විශේෂ සම්මේලනයට පැමිණි අවස්ථාව. ඒ අවස්ථාවේදී මම යම් දෙයක් නමුත්නාත්සේලාට කිව්ව නම්, එයින් භාගයක් මේ මොහොත වෙන කොට ඉෂ්ඨවෙලා තිබෙනව. **එනම්, අපේ රටේ ජනතාව කවදත් බලන්නේ එක්සත් ජාතික පක්ෂය දෙසයි. ඉතුරු භාගය ඉෂ්ඨ කිරීමේ වගකීම මම බාරගන්නව.** එනම්, අපි අපේ ජනතාව දෙස බැලීමේ වගකීම නමුත්නාත්සේලා වෙනුවෙන් මම බාර ගන්නව. මම කැමතියි අපේ ශ්‍රීමත් ජනාධිපතිතුමා මෙවර ජනාධිපති ධූරය සඳහා ඉදිරිපත් නොවීම හේතු කොටගෙන එතුමාගේ යෝජනාවෙන් අපේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ අනුමතියෙන් මහා සම්මේලනයේ සම්මතයෙන් මේ සඳහා ඉදිරිපත් වෙන්ට අවස්ථාව මට සළසා දීම ගැන ශ්‍රීමත් ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාටත් නමුත්නාත්සේලා හැමදෙනාටත් මගේ කෘතඥතාවය මේ අවස්ථාවේ දී පිරිනමන්ට.

## ජීවිත පූජාවෙන් ලත් ජය

මීට කලින් ලංකාවේ කිසිම දේශපාලන පක්ෂයක නායකත්වය කිසිම දේශපාලන පක්ෂයක නායකයෙකුට ලබන්ට බැරිවුන වරප්‍රසාදයක් අපේ ශ්‍රීමත් ජනාධිපතිතුමා ලබාදී තිබෙනවා. මොකක්ද ඒ වරප්‍රසාදය. තමා ගොඩ නැඟූ පක්ෂයේ තමාගෙන් පසු නායකත්වය තමාගේම අනුගාමිකයෙකුට පවරලා ඒ

අනුගාමිකයාට ජනතාවගේ ජන වරම ලබා ගැනීමට පුළුවන් වන ඉඩකඩ සලසා ඒ ජනවරම ලැබීමෙන් උසස් ප්‍රීතියක් බුක්ති විඳීමේ වරප්‍රසාදය අපේ ජනාධිපතිතුමාට පමණයි මේ ලංකාවේ අත්වුනේ. තමන්ගේ අනුගාමිකයින් බොහොම අමාරුවෙන් ජනවරම ලබාගන්නට ගිය අවස්ථාවේදී ඔහුට එය ලබාගන්ට බැරිවන අන්දමේ හැම උපක්‍රමයක්ම යොද ඔහුගේ පරාජය දැක සතුටු වුනු නායකත්වයකුත් අපට පසුගිය කාලෙ දකින්ට ලැබුණු බව තමුන්නාන්සේලා දන්නවා. ඒ නිසා එක්සත් ජාතික පාක්ෂිකයින් හැටියට අප සියළුදෙනාම වාසනාවන්තයි. මෙවැනි උදාර ඉතිහාසයක් ඇති පක්ෂයක සාමාජිකයින් හැටියට අපට ක්‍රියා කරන්න පුළුවන්වීම ගැන. මේ ජනාධිපතිවරණයේ තිබුණ උණුසුම ගැන භයානකත්වය ගැන මීට කලින් ප්‍රකාශ වුනා.

බොහෝ දෙනෙක් කල්පනා කලා ජනාධිපතිවරණය පවත්වන්න අවකාශයක් නොලැබෙයි කියා. සමහර දෙනෙක් කල්පනා කලා. ජනාධිපතිවරණය මේ තත්ත්වය යටතේ පැවැත්වුවත්, එක්සත් ජාතික පක්ෂය පරාජය වේය කියලා. එසේ සිතීම ගැන අපි පුදුම වෙන්නෙ නැහැ. එවැනි දරුණු වාතාවරණයක් තිබුණේ. ස්වභාවයෙන් වුනත් එක්සත් ජාතික පක්ෂිකයා නැත්පත්. කලබල කැරලිවලට කොහෙත්ම කැමති කෙනෙක් නෙමෙයි. දමරිකකම්, භීෂණ ක්‍රියා හමුවෙ එක්සත් ජාතික පාක්ෂිකයින් ස්වභාවයෙන්ම පසුබසින බව අපි කවුරුත් දන්නවා. එක්සත් ජාතික පාක්ෂිකයා ජන සම්මතවාදියෙක්. ඔහු විශ්වාසය තබන්නෙ චණ්ඩි බලය කෙරෙහි නෙමෙයි, ජන්ද බලය කෙරෙහි.ඒ නිසා භීෂණ තත්ත්වය තුළ විශාලම පාඩුව සිද්ධ වුණේ එක්සත් ජාතික පක්ෂයට. හත්අට සියක් අපේ පාක්ෂිකයින් අමු අමුවේ මරා දැම්මා. මේ විදිහෙ මහා විපතකට අතීත් එකම පක්ෂයකටවත් මුහුණ දෙන්නට සිද්ධ වුණේ නැහැ. අපේ පක්ෂයේ නායකයින්, ගමේ මට්ටමේ සිට හැම තරාතිරමකම අපේ පාක්ෂිකයින් අමු අමුවේ මරා දැම්මා. ඔවුන් ජනසම්මතවාදීන් නිසා ජීවිතය පූජා කලා. විශාල වශයෙන් අපේ පාක්ෂිකයින්ගේ ගෙවල් දෙරවල් විනාශ කලා. අපේ පාක්ෂිකයින් මරා දැමුවේ එක් එක්කෙනා හැටියට නොවෙයි. රොතු පිටින්. අපේ මන්ත්‍රීවරු දන්නව අපේ පාක්ෂිකයින් දන්නව. ඒ ඛේදජනක ඉතිහාසය. ඒ විපත් නිසා අනාථ වූ දරු පවුල් සිය ගණනක්. ඔවුන්ට රජයෙන් වන්දි ලැබෙන බව ඇත්ත. නමුත් පක්ෂයක් හැටියට අපෙත් යුතු කමක් තිබෙනව ඔවුන්ගෙන් තඩත්තු වුණ ඒ අසරණ දරු පවුල් රැක බලා ගැනීමට කිසියම් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම. අපේ පක්ෂයේ ඒ එක් එක් දරු පවුලක් පිළිබඳව සමීක්ෂණයක් පවත්වා ඔවුන්ට අවශ්‍ය ආධාර උපකාර කිරීමට බලාපොරොත්තුවෙන බව මම මතක් කරන්න කැමතියි.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

ඒ වගේම මම අපේ මහ ලේකම්තුමාගෙන් ඉල්ලා සිටිනවා ඒ ජීවිත පූජා කළ හැම පාක්ෂිකයෙකුගේම ඡායාරූපයක් ඒ ජීවිත පූජාව පිළිබඳ උපහාරයක් ලෙස සිරිකොත මන්දිරයේ තැන්පත් කර තබන ලෙස.

මගේ උපන් දිනය නිමිත්තෙන් ඇති කළ අරමුදල්වලත් මුදල් ලක්ෂ කීපයක් තිබෙනවා. ඒ හැම සතයක්ම මම මේ අරමුදලට පරිත්‍යාග කරනවා. තමුන්නාසේලාත් තමුන්නාසේලා ගේ ඒ ඒ පළාත්වල ඒ අසරණ පවුල් වෙනුවෙන් කළ හැකි හැම දෙයක්ම කරන මෙන් මම උදක්ම ඉල්ලා සිටිනවා.

## විජයග්‍රහණයට පසු පරාජිතයන් රැක ගැනීම

එතකොට අපි මේ ලබපු ජයග්‍රහණය ජන්ද පත්‍රිකාවේ අලියා ලකුණ ඉදිරියේ පැන්සලෙන් ලකුණු කළ කතිරයෙන් පමණක් ලැබුණු ජයග්‍රහණයක් නොව, අපේ මේ පාක්ෂිකයින්ගේ ජීවිත පූජාවෙන් සහ ඔවුන්ගේ ලෙයින් සළකුණු වුණු ජන්දවලින් ලැබුණු ජයග්‍රහණයක් බව අපි අමතක නොකළ යුතුයි. ජන්දය දෙන්ට සූදානම් වෙද්දී ඔවුන්ට තර්ජන තිබුණා. දැන් ඔබ දන්නවා ජන්දය දුන්නටත් පස්සෙ ඇතැම් පළාත්වල තවත් තර්ජන තිබෙනවා. මේ ජනාධිපතිවරණයේදී ජයග්‍රහණය ගැන පමණක් නොවෙයි මගේ අවධානය යොමු වී තිබුණේ. ජයග්‍රහණයෙන් පසු ජය ලබන්නට අපොහොසත් වූ උදවිය ආරක්ෂා කර ගැනීම සඳහාත් මගේ අවධානය යොමු වී තිබුණා. අපි පරාජය වී දීර්ඝ කාලයක් ඒ පරාජයේ කටුක අත්දැකීම් ලබපු පක්ෂයක්. අපි දන්නව ජන්ද විමසීමකින් පරාජය වුනාම කොයිතරම් හිත් වේදනාවක් ඇති වෙනව ද කියල. ජයග්‍රහණය ලැබුවම ඇති වෙන උද්දාමය වාගේම පරාජයක් ලැබුවාම විශාල දුකක් ඇති වෙනවා. මම කල්පනා කළේ ඒ වේදනාව හුඟාක් දුරට අඩු කරල දෙන්ට. ජයග්‍රහණය ලබන්නට බැරි වෙච්ච අයට. ඒ නිසා තමයි ජන්ද ප්‍රතිඵල ප්‍රකාශ කරපු වෙලාවෙ, පරාජය වෙච්ච අය කියලවත් මම පාවිච්චි නොකළෙ. මම කිව්වේ, ජයග්‍රහණය කරන්න බැරිවෙච්ච අය කියලා. ඇයි මම එහෙම කිව්වෙ? හිතාමතාම ඔවුන්ගේ වේදනාව අඩු කරන්න.

මෑත කාලයක ප්‍රථම වරට ජයග්‍රහණයකින් පසුව ජය ලැබූ අය ජය ලබන්නට බැරිවූ අයට හිරිහැරයක්, කරදරයක් හිංසාවක් පීඩාවක් නොකළ පළමු වැනි වතාව මෙය බව තමුන්නාසේලා පිළිඅරන් ඉවරයි. අපි ඒ ගැන සතුටු වෙන්න ඕන. නමුත් සමහරු ජය ලැබූ අය ප්‍රකෝප කරවන්න උත්සාහ කළා. ඒ උදවිය කියන්න පටන් ගත්තා 'කෝ ජය ලබල ප්‍රීති ප්‍රමෝදයක් නැතෙයි' කියල. මං අහන්න කැමතියි ඒ ගොල්ලො අපෙන් බලාපොරොත්තු වෙන්නෙ මොන විදිහෙ ප්‍රීති ප්‍රමෝදයක් ද කියල? ඒ ගොල්ලො බොහොම කැමතියි කවදත් ලේ දකින්න. ඒ

ගොල්ලො බොහොම කැමතියි කවදත් කඳුළු දකින්න. ඒ ගොල්ලො කවදත් කැමතියි මළ මිණී කරේ තියාගෙන ඉන්න. ඒ දෙළදුක පිරිමහන්න අපි ඉදිරිපත් නොවන බව මම ඒ ගොල්ලන්ට මතක් කරන්න කැමතියි.

මම ශ්‍රී ලංකාවේ ජය ලැබූ ජනතාවට මගේ ගෞරවය පිරිනමනව. අප ලැබූ ජයග්‍රහණයට වඩා ලොකු විජයග්‍රණයක් හැටියට මම සළකනව, ජයග්‍රණයෙන් උන්මාද වෙලා ජයග්‍රණයෙන් වියරු වැටිල ජය ලබන්නට බැරි වූ අයට හිරිහැර කරදර හිංසා පීඩා නොකොට තමුන්නාන්සේලා දක්වූ උදර ගුණය ගැන. මම මගේ විජයග්‍රණයක් හැටියටයි එය සළකන්නෙ.

මෙවැනි ඡන්ද විමසීමකින් පසුව ජනසම්මතවාදී සර්වජන ඡන්ද විමසීම් වලින් පසුව ජයග්‍රහණය කළ පක්ෂයටත් ජය ලබන්ට බැරිවෙච්ච පක්ෂයටත් ඉගෙන ගන්න පාඩම් රාශියක් තිබෙනවා.

## පරාජය ජය ගැනුමට නම් . . . .

අපට පළාත් ගණනාවකින් පරාජයට මුහුණ පාන්න සිද්ධ වුණා. ඊට ප්‍රධානතම හේතුව හිංසාව සහ පීඩනය. නමුත් අපි කැමතියි අපි කවුරුත් ඒ හේතුව පිට සැනසෙන්නෙ නැතිව ඊවාට තවත් හේතු තිබුණා ද කියල පරීක්ෂා කරල බලන්න. බොහොම ලේසියි අපිට සැනසෙන්න මොනවද කරන්නෙ. හතළිස් දහක් ඡන්ද දායකයො හිටිය නෙ. ඡන්දෙට ආවෙ දහ දහයි නැත්තම් විසිඑක් දහයි. මගේ ඡන්ද දායකයො එන්නෙ කොහොම ද? ඒ ගොල්ලන්ගෙ නෑදෑයො මිත්‍රයො මරල තිබෙනව. හිරිහැර කරදර කරල තිබෙනව. හතළිස් දහක් හිටපු තැන දහ දහක් ආවෙ. අනික් තිස් දහ ආවනම් මම මෙයටත් වඩා විශිෂ්ඨ ජයක් ලබනවා. ඔය විදිහෙ සැනසිල්ලක් අපට ඇති කර ගන්න පුළුවන්. මම ඉල්ලා සිටිනවා ඒකත් එක හේතුවක් හැටියට අරගෙන තවත් හේතු තිබෙනවද කියල අපි කවුරුත් පරීක්ෂා කරල බලන්න ඕන.

දැන් අපි ක්‍රීඩා පිටියකට ගියහම, ෆුට්බෝල් මැච් එකකට සහභාගී වූනාම ක්‍රිකට් මැච් එකකට සහභාගී වූනාම, පරාජය වූනාම අපට බොහොම ලේසියි කියන්න අපේ ක්‍රීඩකයො තුන් හතර දෙනෙක් තුවාල ලබල පිටියෙන් ඉවත් වූනා - ඒ ගොල්ලො හිටිය නම් අපට දිනන්න තිබුණ කියල සැක කරන්න පුළුවන්. නමුත් අපි එහෙම කරන්නෙ නෑ. අපි බලනව තවත් හේතු තිබුණද. අපේ ක්‍රීඩකයන්ගෙ යම් යම් දුර්වලකම් තිබුණද. ඊළඟ මැච් එකත් අපි දිනන්න ඕන. නැත්තම් අන්තිම කප් එක ගන්න බෑ. ඒ නිසා අපි ක්‍රීඩකයො ටිකක් එහෙන් මෙහෙන් මාරු කරනව ද කියල අපි කල්පනා කරන්න ඕන.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

අපි මේ ක්‍රීඩා කණ්ඩායමට උදව් කරන උදවිය. ඒ සියළු දෙනාටම ඒ ක්‍රීඩා කණ්ඩායමට බැදෙන්න බැහැ. එකොළොස් දෙනාටයි ක්‍රීඩා පිටියට යන්න පුළුවන්. අනිත් අය ඔක්කොම වටේ ඉඳගෙන අත්පුඩි ගහනවා. අපේ කීප දෙනෙක් පිට්ටනියට බැහැල සෙල්ලම් කරනවා. ඒ මැච් එක පැරදුනත් කමක් නෑ. අනිත් එක දිනන්න ඕන. කොහොම හරි කරලා කප් එක ගන්න ඕන. ඒක තමයි ක්‍රීඩා සමාජයේ හැම දෙනාගේම අභිප්‍රාය.

මුළු ක්‍රීඩා සමාජයම එකතු වෙලා තමයි කැප්ටන්ව තෝරන්නෙ. නායකයා තෝරන්නෙ. එයාට කියනවා තවත් හොඳ දහ දෙනෙක් එක්කගෙන කරගෙන මේ ටූනමන්ට් එක දිනන්න ඕන. මේ තරඟ මාලාව දිනන්න ඕන. කොහොම හරි කප් එක අපේ සමාජයට ලබා දෙන්නටය කියල.

මම විශ්වාස කරනවා තමුන්නාන්සේලා මාව පත් කළේ එවැනි කැප්ටන් කෙනෙක්ය කියල හිතාගෙන බව.

මම පළමවෙනි මැච් එක දිනල දුන්න තමුන්නාන්සේලාට. කප් එක ගන්න නම් අනිත් මැච් එකත් දිනන්න ඕන. ඉතින් මම පළවෙනි මැච් එකේ අත්දැකීම් අනුව තමයි, ඊළඟ මැච් එකට ක්‍රීඩකයින් තෝරන්නෙ.

අපේ ටීම් එකේ ඉන්නව හොඳ නම් දරාපු ක්‍රීඩකයෝ. ජගත් කීර්තියට පත් වෙච්ච ක්‍රීඩකයෝ සමහර ක්‍රීඩා කණ්ඩායම්වල ඉන්නවා. නමුත් ඒ එක් එක් අවස්ථාවල්වලදී ඒ ගොල්ලන්ට හෙම්බිරිස්සාව හැදිල තිබෙනවා. කකුලෙ තුවාලයක් තිබෙනව නම්, වෙන අමාරුවක් තිබෙනව නම්, කොච්චර කීර්තිමත් ක්‍රීඩකයෝ වුනත් හොඳ කැප්ටන් කෙනෙක් ඒ අයව සෙල්ලම් කරන්න දන්නෙ නැහැ. කීර්තිමත් භාවය ගැන කල්පනා කරල, එයාගෙ ශාරීරික ස්වභාවය ගැන කල්පනා නොකොට ක්‍රීඩාවට දැම්මොත් පරදිනවා. මෙන්න මේ විදියට කල්පනා කරල තමයි අපේ අද මේ නාම යෝජනා මණ්ඩලය මීළඟ මැච් එකට ක්‍රීඩකයින් තෝරන්නෙ.

අපි පුළුවන් තරම් උත්සාහ කරනව අපේ ක්‍රීඩකයින්ව ඉදිරිපත් කරන්න. නමුත් මේ ක්‍රීඩා සමාජයෙ මම නායකත්වය දරණ ක්‍රීඩා සමාජයෙ - මම කැමතියි කණ්ඩායම් කීපයක් ඇතිව මේ වැඩ පිළිවෙළ ගෙනියන්න. අපි ෆුට්බෝල් සෙල්ලම් කරන කාලෙ අපේ තිබුණ 'ඒ' ටීම් එක, 'බී' ටීම් එක, 'සී' ටීම් එක. තව කීපයක් තිබුණ, වයස පහලොවෙන් පල්ලෙහා කියල ටීම් එකකුත් තිබුණා. වයස 15 න් පල්ලෙහා සෙල්ලම් කරල දක්ෂකම් දක්වපු අය 'සී' ටීම් එකට. 'සී' ටීම් එකේ දක්ෂ අය 'බී' ටීම් එකට. 'බී' ටීම් එකේ දක්ෂ අය 'ඒ' ටීම් එකට යන සිරිතක්

තමයි අපේ ක්‍රීඩා සම්ප්‍රදයෙ තිබෙන්නෙ. සමහර උදවිය ඒ ගොල්ලන්ගෙ පරණ පිතක් පැදිල අත්ඩ හීන්වින් එකේ සෙල්ලම් නොකර කෙලින්ම ඒ ටීම් එකෙන් සෙල්ලම් කරල තිබෙනවා. එහෙම අය තමයි වලව්වෙන් කච්චේරියට ගිහිල්ලා කච්චේරියෙන් පාර්ලිමේන්තුවට යන්නෙ. මම 'ඒ' ටීම් එකේ සෙල්ලම් කළේ මුලින්ම අත්ඩ හීන්වින් එකේ සෙල්ලම් කරල. 'සී' ටීම් එකේ, 'බී' ටීම් එකේ, අන්තිමට 'ඒ' ටීම් එකේ. එක අවුරුද්දක් මගේ ක්‍රීඩාව ඒ තරම් හොඳ නැතිවෙච්ච නිසා මගේ නායකතුමා මට කිව්ව "අයියෙ ප්‍රේමදාස තමුසෙ මීළඟ මැච් එකේ හොඳට සෙල්ලම් කළේ නැත්තම්, තමුසෙව 'බී' ටීම් එකට දන්නෙ නැහැ" කියල. ඒ කැප්ටන් කවුද කියල මම තමුන්නාන්සේලාට මතක් කරල දෙන්න කැමතියි.

ඒ කැප්ටන් තමයි අපේ ගෙදර කැලි කසළ ඉවත් කරන්න ඒ කාලෙ අපේ පියා පඩියට පත් කරගෙන හිටපු රාමයියා කියන ඉන්දියාවෙන් මෙහාට ඇවිත් සේවය කරපු සේවකයා. එයත් මගේ වයසෙම යි. එයාගේ පියා තමයි මුලින්ම ඒ යෝජනාව කළේ. උදේට අපේ ගෙදර කැලි කසළ ආදිය ඉවත් කරන්න ඒ පුද්ගලයා ආවහම අපට ආමන්ත්‍රණය කරන්නෙ රාසා කියල. රජ්ජුරුවෝ කියල කියන්නෙ. තමුන් හැන්දෑවට ප්‍රයිස්පාක් පිට්ටනියේ පුට්බෝල් ගහන්න ගියහම රාමයියා තමයි කැප්ටන් අපේ ටීම් එකේ. එතෙන්දි මට කතා කරන්නෙ දෙරේ කියල. එතකොට එයාගේ නායකත්වය යටතේ තමයි අපි ප්‍රයිස්පාක් පිට්ටනියෙ පුට්බෝල් ගැහුවෙ.

එක දවසක් ඒ කැප්ටන් තමයි මට කිව්වෙ සෙල්ලම් කරනව ඒ තරම් හොඳ නෑ. මීළඟ මැච් එකේ හොඳට සෙල්ලම් කෙරුවෙ නැත්තම් 'බී' ටීම් එකට දන්නෙ නෑ කියල. මම ඒ වෙලාවෙ කිව්වෙ නෑ උඹ අපේ වැඩකාරයා, උඹට මොන අයිතියක් තියෙනවද මාව 'ඒ' එකෙන් 'බී' එකට දන්න උඹ බලාගනින් උඹ රස්සාවෙන් අස් කරනව කියල මම තර්ජනය කළේ නෑ. කැප්ටන් කෙරෙහි විශ්වාසය තියල අපි වැඩ කළා. ඊළඟ මැච් එකේ මම හොඳට සෙල්ලම් කෙරුව. මොකක්ද උනේ? මාව ටීම් එකේ උපනායකයා හැටියට එයා පත් කෙරුව.

## පොදු ජනතාව කෙරෙහි කැපවීම

ඒ නිසා සහෝදර සහෝදරියනි, තමුන්නාන්සේලා පත් කරගෙන ඇති කැප්ටන් හොඳට අත්දැකීම් ඇති කැප්ටන් කෙනෙක්. මේ පාර මැච් එකට කාව හරි දම්මෙ නැත්තම් මගෙන් හේතු අහන්න එන්න එපා. දරු පවුල් පිටින් ඇවිල්ල මා ඉදිරියෙ අඩා වැළපෙන්න එපා. චෝදනා කරන්න ඕනෑ නම් ඕන චෝදනාවක් කෙරුවට කමක් නෑ. මම කැපවෙලා ඉන්නේ මේ රටේ අහිංසක ජනතාවගේ දෙනෙත් තුළ

නගින දුක් කඳුළු පිස දමන්නට මිස එක්කෙනෙක්ගෙ දෙන්නෙක් ගෙ කඳුළු පිසදමන්න නෙවෙයි. තමුන්නාන්සේලාට කියවන්න ලැබිල ඇති, ආරංචි වෙලා ඇති බණ්ඩාරනායක මහත්මිය මේ මැතිවරණයේ දි කියපු ප්‍රකාශයක්. එතුමිය කිව්ව ජේ. ආර්. හොඳ මිනිහෙක් නෙවෙයි. ප්‍රේමදාස ඊටත් වඩා නරක මිනිහෙක් කියලා. බලන්න කල්පනා කරලා එයා මගේ ටීම් එකට සෙල්ලම් කරලත් නැහැ. මම දන්නේ නැහැ එයා කොහොම මාව අඳුනගත්ත ද කියල. එතුමිය එක්ක කිට්ටුවෙන් ඉන්න බොහෝ දෙනෙකුට වඩා කලින් මම එතුමියව හමුවෙලා තිබෙන්නෙ. බණ්ඩාරනායක මැතිතුමත් සමඟ සරණබන්ධනප්‍රාප්ත වෙලා, කොළඹට ආවට පස්සේ ඒ අලුත් මනාල ජෝඩුව මුලින්ම ආපු උත්සවය තමයි මට එතකොට වයස 16 යි. ශ්‍රී සුචරිත ව්‍යාපාරය - ත්‍යාග ප්‍රදානෝත්සවය. සමහර අයට එවැනි ඉව තිබෙනව. කෙනෙක්ව දැක්කම කෙනෙක්ව තේරුම් ගන්න පුළුවන් ශක්තිය තිබෙනව. මාව හරියට තේරුම් ගැනීම ගැන බණ්ඩාරනායක මහත්මියට මම ස්තුතිවන්ත වෙනව. එතුමිය කියන්නේ ජේ. ආර්. එක්ක සෙල්ලම් කළත් ප්‍රේමදාස එක්ක සෙල්ලම් කෙරිල්ල එතරම් ලේසි නෑ කියල.

පොදු සුභ සිද්ධියට වඩා අපි පෞද්ගලික ඕනෑ එපාකම් ගැන කල්පනා කරනව මේ රටට වෙච්ච විපත මේකයි. මම අධිෂ්ඨාන කරගෙන ඉන්නව, තමුන්නාන්සේලා දුන්න මේ ජනවරම ප්‍රයෝජනයට අරගෙන මේ ක්‍රමය වෙනස් කරන්න. මම හැම කාරණයක් ම බලන්නෙ පෞද්ගලික ඕනෑ එපාකම්වලට වඩා පොදු සුභ සිද්ධිය පදනම් කරගෙනයි. මමත් ඊට සුදුසු වන අන්දමට නවදුරටත් හැඩගැහෙන්න බලාපොරොත්තු වෙනවා. පෞද්ගලික අයිතිවාසිකම් හුඟක් තහවුරුකරගෙන මේ පොදු ශුභ සිද්ධිය ඇති කිරීම අමාරුයි.දැන් පොදු ජන සේවයට ජනවරමින් ඉදිරිපත්වන අයට ජනතාවගේ වරිපනම් වලින් හොඳට පඩි නඩි ගෙවනව. වරප්‍රසාද ලබාදීල තියෙනවා. ඒ නිසා පොදු ජන සේවයට ඉදිරිපත් වන අය අපි කවුරුත් අපේ පුද්ගලික අයිතිය හුඟාක් දුරට සීමා කරගන්නට කල්පනා කරන්නට ඕන. ජනතාව අප කෙරෙහි විශ්වාසය තබන තත්ත්වයට අපේ චාරිත්‍රධර්ම අපි සකස් කර ගන්න ඕන. ගුණාත්මක භාවය කොයිතරම් උසස් ඉල්លුමක් වුනත් ඉදිරිපත් කිරීමක් වුනත් අද දේශපාලනඥයින්ට බැරිවෙලා තිබෙනව ඒක පිළිගන්න මන්ද ගාස්තුව වැඩි නිසා.

ටෙන්ඩර් එකක් කැඳෙව්වම ඒ ටෙන්ඩර් එක පරීක්ෂා කරල බලන කොට, ඒ ටෙන්ඩර් එකේ ගුණාත්මක භාවයෙත් උසස්. ඒ වගේම මිලත් උසස්. නමුත් අද දේශපාලනඥයින් ඒක පිළිගන්නේ නෑ. මන්ද? කතාවක් ඇති වෙයි - මේකෙන් මෙයාට කොමිස් එකක් ලැබෙන්න ඇත්ද, මෙයාගෙ බැංකු ගිණුමකට යන්න ඇත්ද, මෙයාගෙ නෑයෙකුට යන්න ඇත්ද, ඒ නිසා තමයි මෙයා මේ ඉහළම ටෙන්ඩරය බාර

ගත්තෙ. ඒ නිසා අද දේශපාලනඥයො පෙලඹෙනව - ගුණාත්මක භාවය කොච්චර අඩු වුනත් අයිසෙ ඇඟ බේරගන්න පුළුවන් ලෝවස්ට ටෙන්ඩර් එක බාරගම්මු කියල.

අපට ශක්තිය තිබෙන්න ඕන - අපට ආත්ම ශක්තිය තිබෙන්න ඕන - අපේ පුද්ගලික අයිතිය හුඟාක් දුරට සීමා වෙන්න ඕන - ගුණාත්මක භාවය උඩ රටට ප්‍රයෝජනවත් විදිහට වැඩ කරන්න. මම පසුගියදා එක රටකට ගියහම පුදුම දෙයක් දැක්කා. විශාල ගංගාවක් හරහා පාලමක් දාල තිබුණා. ඒ පාලමේ අන්තිම කෙළවර කඩාගෙන වැටිල තිබුණා. ඒ පාලම හැදෙව්වෙ - රාජ්‍ය නායකයින්ගෙ සම්මේලනයට එන අමුත්තන්ට විවේකායතනයට ගිහිල්ල විවේක ගන්න ඕන නිසා ඒ ගඟ හරහා මේ පාලම හැදෙව්ව කඩිනමින්. වාසනාවකට වාගෙ ඒ රාජ්‍ය නායක සමුළුව තියන්න ඉස්සෙල්ල මේ පාලමේ එක කෙළවරක කොටසක් කඩාගෙන වැටුණ. ඛේදවාචකයක් සිද්ධ වුණා. ඒ පාලමේ ඒ කෙළවර කඩා වැටෙනකොට ඒ වෙලාවේ ඒක උඩින් ගිය බස් රථයක් මගීන් සමඟම ගඟට වැටුණා. අපි ගියහම අපට පුදුමයක් - මේ පාලමේ විශාල කොටසක් තියෙද්දි අන්තිම කෙළවරේ අඩි 50ක් විතර කඩාගෙන වැටිල. මම මේකෙ විස්තර ටිකක් හෙව්ව. මොකක් ද මට කිව්වෙ, ලෝවස්ට ටෙන්ඩර් එක භාර ගන්න හිත්දය කිව්ව. ඒක හොයල බැලුව.

ඒක තීරණය කරපු අය බයවෙලා තියෙනව ගුණාත්මක භාවය පදනම් කරගෙන වෙන ටෙන්ඩරයක් බාර ගන්න. එනකොට මට කිව්වෙ මේකයි - හුඟාක් චෝදනා තියෙනව. මේ විදිහට. ඒ වැඩකටයුතු භාර අයට විරුද්ධව. මං කිව්ව ඒ ගොල්ලො යථාර්ථයට මුහුණ දීල මේ ගොල්ලො - ක්‍රියා නොකලෙ. මට කිව්ව සැකය ඇතිවෙන ආකාරයෙන් ඒ ගොල්ලන්ගෙ නැදෑයෝ ධනවත්වෙලා තියෙනව. අන්න ඒව වහගන්න තමයි පස්සෙ ඒ ගොල්ලො ලෝවස්ට ටෙන්ඩරයට ගියෙ. එහෙනම් මොකක් ද මේකෙන් අපි ඉගෙනගන්න ඕන පාඩම. පොදු ජන සේවයට ඉදිරිපත් වෙනව නම් පොදු ජන සේවය යි. එහෙම නැතුව පෞද්ගලික ව්‍යාපාර තරකරගෙන පොදු ජන ව්‍යාපාරයට ඉදිරිපත් වීම සුදුසු නැහැ. මම කියන්නෙ නැ හිභාකන්නෙයි කියල. තමන්ගෙ ධාර්මික ව්‍යායාම තිබෙනව. ජීවනෝපාය තිබෙනව. ඒවාට අමතරව පොදු ජන සේවයට ඉදිරිපත් වෙන අයට පාරිතෝෂික දීමනාවල් තිබෙනව. අලුත් නීතිය යටතේ ඕනම කෙනෙක්ගෙ වත්කම් බැරකම් ඕනම පුරවැසියෙකුට පරීක්ෂා කරන්න පුළුවන් බව කරුණාකරල මතක තියාගන්නා මෙන් ඉල්ලා සිටිනවා.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

## අලුත් මුහුණු තුළින් නව මුහුණුවරක්

මේව ඔක්කොම සැලකිල්ලට ගන්න ඕන මේ පාර නාම යෝජනා ඉල්ලන කවුරුත්. අපේ පක්ෂයේ කීර්ති නාමය අපි ආරක්ෂා කර ගන්න ඕන. මේකත් යම් යම් ප්‍රදේශවල ඡන්ද අඩු විමට හේතු වුන බව අපි හිතට ගන්න ඕන. රටේ බොහෝම හොඳින් රජයේ වැඩ පිළිවෙලවල් කෙරිල තිබෙනව. සංවර්ධන වැඩ පිළිවෙලලවල් කෙරිල තිබෙනව. බලයේ ඉන්න කාලෙදි ලක්ෂ ගාණක් වැඩිවෙලා තිබෙනව. නමුත් මේ පාර අසතුටුදායක තත්ත්වයක් ඇති වුනා.

ඊළඟට අපි කල්පනා කරන්න ඕන තවත් අපේ පක්ෂෙ උදවියට අවස්ථාවක් සළසා දෙන්න. යාම්තම් හෝ ඉඩක් තිබෙනව ද තවත් කෙනෙකුට අවස්ථාවක් දෙන්න. අපි බොහොම සන්තෝසෙන් ඒ අවස්ථාව ලබා දෙන්න ඕනේ.

මේ තත්ත්වය ඉදිරියට ගමන් කරන්න ඕනෙ. අපි හැමදම මේ තත්ත්වයේ ඉන්නේ නැහැ. අර 'බී' විම් එක 'සී' විම් එක අපි හදන්න ඕනැ. මමම කෘත්‍යාධිකාරී මණ්ඩලයට කියන්න බලාපොරොත්තු වෙනවා කරුණාකරල මීට පස්සේ අපේ සම්මේලණ විසඳුමක් ඇතිව ක්‍රියා කරන්න බලාපොරොත්තු වෙන්නයි කියල. අපි පුළුවන් තරම් අපේ තත්ත්වය නියෝජනය ඒ ඒ මට්ටම්වලින් ඡන්දය ලබාගෙන එන අයට දෙන ක්‍රමයකට අපේ ව්‍යවස්ථාව අපි හදගන්න ඕන. අපේ පක්ෂයේ ඉන්නවා හුගාක් දක්ෂ පක්ෂකම් ඇති අය. ගම්දනව්වල නගරවල. ඔවුන්ට ඉස්සරහට එන්න අවකාශයක් නැහැ. අපි පුළුවන් තරම් ඒ ඒ ප්‍රදේශවල ඒ දක්ෂ පක්ෂකම් ඇති අය මතුවන ආකාරයට අපේ පක්ෂයේ ව්‍යවස්ථාව අපි සකස් කර ගන්න ඕනැ. මේවාගේ පැරදුන පක්ෂයත් කල්පනා කරන්න ඕනැ ජය ලබන්න බැරිවුන පක්ෂ කල්පනා කරන්න ඕනැ ඇයි තමන්ගේ පරාජයට හේතුව කියල අපි දිනපු කණ්ඩායමක් හැටියට මෙහෙම කල්පනා කරනවා නම් ඒගොල්ලො ඊටත් වඩා ගැඹුරට කල්පනා කරන්න ඕනැ. අපේ පක්ෂයේ නැති අඩුපාඩුකම් පෙන්නලා ඒගොල්ලන්ගේ බැරිකම වසා ගැනීම නෙමෙයි කල යුත්තේ.

මම දැනගත්තා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ජනතා විශ්වාසය දිනාගන්න බැරි බව රොනී ද මෙල් මහතා ඒ පක්ෂයට බඳවා ගත්ත දවසෙ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පලවැනි දුර්වලතාවය ප්‍රදර්ශනය වුනා. දෙවැනි වරට පක්ෂ අටක් එක්ක සම්බන්ධයක් ඇති කර ගන්නට පස්සේ මම දැන ගත්තා තවත් දුර්වල වෙන බව. තමාගේ පක්ෂයට සමාන ප්‍රතිපත්ති තිබෙන පක්ෂ සමඟ හවුලක් ඇති කර ගන්නට වරදක් නැහැ. වෙනස්කම් ඇති පක්ෂ සමඟ හවුලක් ඇති කර ගන්න උත්සාහ කලා. මෙය ජයලබන්ට ඕනැමයි කියල ඇති කර ගන්න හවුලක් බව ජනතාව තේරුම් ගත්ත. අන්න අට හවුලට වෙලා තියෙන දේ නමුත්නාත්සේලා දැන්

දන්නවා. ජනාධිපතිවරණයට ඉස්සෙල්ලාම අට පහට වැටුනා. මම හාස්‍ය ලෙස කිව්වා පරාජය වන පක්ෂයක් කියල. දැන් පරාජයෙන් පස්සේ මොකද වෙලා තියෙන්නේ පහ තුන වෙලයි තියෙන්නේ. තුනට මොනවා වෙයිද කියල මට කියන්න අමාරුයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, ලිබරල් පක්ෂය, ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂය, බණ්ඩාරනායක මහත්මියගේ නිදහස් පක්ෂය, චානක අමරතුංග මහතාගේ ලිබරල් පක්ෂය, ඒ. අසීස් මහතාගේ ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂය.

අපි හොඳට අපේ ටීම් එක තෝර ගත්තොත්, 'ඒ' ටීම් එකට ඇතුල්වන අය ඇතුල් වෙන්න බැරිවෙච්ච අය ඒගොල්ලො හොඳට ධෛර්‍යසම්පන්නව ක්‍රියා කලොත් අපට පුළුවන් වේවි විශිෂ්ඨ ජයග්‍රහණයක් අතික් මැතිවරණයේදී ලබාගන්න.

## ආදර්ශමත් නායකයෙක්

මේ අවස්ථාවේ විශිෂ්ඨ ආදර්ශයක් තමුන්නාන්සේලා ඉදිරියේ තබන්න කැමතියි. මොන්ටේගු ජයවික්‍රම මැතිතුමාගේ අවසරය මට තියෙනවා. මේජර් මොන්ටේගු ජයවික්‍රම මැතිතුමා මට ඒ අවසරය දුන්න දැන්. එතුමා අප පක්ෂයේ ආරම්භක නායකයෙක්. මේ පක්ෂය ආරම්භ වෙච්ච දවසෙ ඉඳල මේ මොහොත වෙනකං අපේ පක්ෂය නඟා සිටුවන්නට ක්‍රියාකළ නායකයෙක්. මැති ඇමතිකම් කරපු නායකයෙක්. අපේ රටේ ජනතාව තමන්ගේ උසස් ජන සේවකයෙක් හැටියට සලකපු නායකයෙක්. මම එතුමාට වඩා කණිෂ්ඨයි මේ පක්ෂයේ. මට හැමවිටම එතුමා හැම ආකාරයකින්ම උදව් කරලා තියෙනවා. මම මේ පක්ෂයට බැඳිච්ච දවසෙ ඉඳල උපදෙස්වලින් නොයෙක් අර්බුදකාරී අවස්ථාවලදීත්, මාව ආරක්ෂා කර ගනිමින් ක්‍රියා කරන නායකයෙක්. තමුන් මට සිද්ධවුනා පෙරේද එතුමාට සිරිකොතට එන්නෙයි කියන්න. මම එතුමාට ඒ අවස්ථාවේදී කිව්වා, මම දිවුරුම් දුන්නාට පස්සේ මට රාජකාරියක් තියෙනවා ඉෂ්ට කරන්න. දැනට තිබෙන්නේ අපේ ශ්‍රීමත් ජනාධිපතිතුමා පත් කරපු කැබිනට් මණ්ඩලය. ඒ අතර පාර්ලිමේන්තුව විසුරුවා හැරල තියෙනව. එවැනි අවස්ථාවකදී අලුතෙන් ජනාධිපතිවරයකු පත්වුනාම මොකක්ද ඇති වන තත්ත්වය. ඒ අලුත් ජනාධිපතිවරයාට අලුත් කැබිනට් මණ්ඩලයක් පත් කර ගැනීමට පුළුවන්කමක් නැහැ පාර්ලිමේන්තුව නැති නිසා. එම අලුතෙන් පවත්වන ජනාධිපතිට සිද්ධ වෙනවා. ඒ දැනට තිබෙන කැබිනට් මණ්ඩලය සමඟ මහ මැතිවරණය අවසාන වෙනකං ක්‍රියා කරන්න. ඒ කැබිනට් මණ්ඩලයේ යම් කෙනෙක් අස්වුනොත් එහෙම නැත්නම් අලුත් ජනාධිපති ඒ කැබිනට් මණ්ඩලයේ යම් කෙනෙක් ඉවත් කලොත් එහෙත් එතුමාට පුළුවන්කමක් නැහැ අලුත් කෙනෙක් පත් කරන්න. අපේ

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුවේ මන්ත්‍රී කෙනෙක් පමණයි ඇමතිවරයෙක් හැටියට පත් කරන්න පුළුවන්. එහෙම යම් ඇමතිවරයෙක් ඉල්ලා අස්වුනොත් එහෙම නැත්නම් ජනාධිපති ඉවත් කළොත් එතකොට ඒ ඇමතිවරයාගේ කාර්ය භාරය අර ඉන්න අනික් ඇමතිවරුන් අතරේ බෙදා දෙන්න පුළුවන්. එහෙම නැත්නම් ජනාධිපති යටතේ තියාගන්න පුළුවන්.

දැන් අපි හිතමු බණ්ඩාරනායක මහත්මිය ජනාධිපති ධූරයට පත් වුනායි කියල. එයා තමයි වැඩියෙන්ම මේ පාර්ලිමේන්තුව විසුරුවා හරින්නයි කියල කිව්වේ. එතකොට එයා පත්වුනා නම් එයා හරි ඇබැද්දියකටයි මුහුණ දෙන්නේ. එයාට සිද්ධවෙනවා අපිත් එක්ක මේ ආණ්ඩුව ගෙන යන්න අනික් මැතිවරණ ප්‍රතිඵල එනකං. එහෙම නැත්නම් එයාට සිද්ධ වෙනවා අපි ඔක්කොම ගෙදර අරින්න. මට ආරංචියි එයා පත්වුනා නම් ඉක්මණට දිවුරුම් දීල අපිව ගෙදර අරින්න බලාපොරොත්තු වුනා කියල. නමුත් එයාට ඇමති මණ්ඩලයක්. පත්කර ගන්න පුළුවන්කමක් නැහැ පාර්ලිමේන්තුව නැති නිසා. නමුත් ජනාධිපති හැටියට එයාට පුළුවනි. සියලුම අමාත්‍යාංශ භාරව ක්‍රියා කරන්න. අනික් පාර්ලිමේන්තු මැතිවරණය එනකං.

මම දැන් පත්වුනාම මට එවැනි ඇබැද්දියක් ඇති වෙලා නැහැ. මන්ද අපේම කැබිනට් මණ්ඩලයක් දැන් තියෙනවා. මේ කැබිනට් මණ්ඩලය සමඟ මට වැඩ කරන්න සිද්ධ වෙනවා මහ මැතිවරණය වෙනකං. ඒ වුණත් මම කල්පනා කළා ටිකක් ඇමතිවරු අඩු කරන්න. මම කල්පනා කළා කොහොමද මේක කරන්නෙ. ඔක්කෝම ඇමතිවරු බොහොම දක්ෂයි. පක්ෂයට බොහොම හිතවත් අය. රටට ආදරය ඇති අය. නමුත් මට ටිකක් කුඩා කැබිනට් මණ්ඩලයක් ඕනැ කරනවා. මාසයයි තව දවස් කිහිපයෙකුයි තිබෙන්නේ අලුත් පාර්ලිමේන්තුව පත් වෙන්න. ඒ වාගේම යම් යම් අයට ඉඩකඩත් ලැබෙනවා තමන්ගේ ඡන්ද කොට්ඨාශවලට ගිහිල්ලා තමන්ගේ ඡන්ද ව්‍යාපාරය කර ගෙන යන්න. මම කල්පනා කළා මෙවර ජනාධිපතිවරණයේදී වැඩි ඡන්ද ගණනක් ගන්න බැරි වෙච්ච ඇමතිවරුන්ට කියන්න මම පත්වුනාම කරුණාකරල තමන්ගේ පදවි වලින් ඉවත් වෙන්න කියල. මට තවම එය කියන්න බලයක් නැහැ දෙවෙනිද වෙනකං. නමුත් මම අපේ මොන්ටේගු ජයවික්‍රම ඇමතිතුමාට සිරිකොතට එන්න කියලා මේක කිව්වා. එතකොට එතුමා කිව්ව ඒකට කමක් නැහැ, නමුත් මම කැමතියි වැලිගම ආසනයට ඉදිරිපත් වෙන්න. මම කිව්වා එතුමාට ඒක මට තනියම කරන්න අයිති වැඩක් නොවෙයි. මේ තත්ත්වයට මං පත්වෙන්නත් ඉස්සෙල්ලා නාම යෝජනා මණ්ඩලයක් පත් කරලා තියෙනවා මම ඒ උදවියට ඒක දැනුම් දෙන්නම් කියල . මම ඒක නාම යෝජනා මණ්ඩලයට දැනුම් දුන්නා. එතුමාවත් නාම යෝජනා මණ්ඩලයට කැඳෙව්වා. නාම යෝජනා මණ්ඩලය එතුමාට කිව්වා නමුන්නාන්සේ

මෙවර ඉදිරිපත් නොවෙනවා නම් හොදයි කියල. එම තීරණය එතුමාට භාර ගන්න සිද්ධ වුණා. මම හිතුවා එතුමා බලවත් චිත්ත පීඩාවකට පත් වෙයි. එතුමා අපේ පක්ෂයෙන් ඉවත් වෙයි. මොකක් හරි සම්බන්ධයෙන් හිත් අමනාපයක් ඇති වෙයි කියල. නමුත් ඊයේ මට ලියුමක් ලැබුනා එතුමාගෙන්. මොකක් ද ඒ ලියමන. එතුමා කියනව මම දනටමත් අපේ ශ්‍රීමත් ජනාධිපතිතුමාට මම ඇමති ධුරයෙන් අස්වෙන ලියමන යැව්ව. තමුන්නාන්සේ මගේ කටයුතු වලට කරපු උදව් උපකාර වලට මම ස්තුතිය පිරිනමනවා. එපමණක් නොවෙයි ආරම්භක සාමාජිකයෙක් හැටියට දීර්ඝ කාලයක් මේ පක්ෂයට සේවය කරපු කෙනෙක් හැටියට ඉදිරියටත් එක්සත් ජාතික පක්ෂය තහවුරු කරන්ට ක්‍රියා කරනවා කියල. කවුද මෙහෙම කථා කරන්නෙ. තමන්ගේ ඇමතිකම, තමන්ගේ මන්ත්‍රීකම ලැබෙන්නෙ නැහැයි කියල දනගෙනත් එහෙම කථා කරන පාක්ෂිකයො සමග වැඩ කරන්ට ලැබීම මහත් වරප්‍රසාදයක් හැටියට තමුන්නාන්සේලා කල්පනා කරන්න ඕන. මෙය, විනය පිළිබඳ විශිෂ්ඨ ආදර්ශයක්. අදත් මේ සම්මේලනයට පැමිණ එතුමා වාඩිවෙලා මේ මුළු වැඩ පිළිවෙලටම සහභාගි වෙනවා.

මම මොන්ටෙගු ජයවික්‍රම ඇමතිතුමාට කියන්න කැමතියි තමුන්නාන්සේ මේ දීපු ආදර්ශය ඔය වැනි පදවි සිය ගණනක් කරල රටට කරන සේවයට වඩා උසස් සේවාවක් කියල. මම එතුමාට මතක් කරන්න කැමතියි. රොනී ද මෙල්ගේ තත්ත්වය. දන් තමුන්නාන්සේලාට වඩාත් හොදට අවබෝධ කරගන්න පුළුවන්. මම හිතුවා මේ පසුගිය ජනාධිපතිවරණය සාධාරණ ලෙස අපි කාටත් සතුටුවන්ට පුළුවන් අන්දමට පවත්වන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ක්‍රියා කරයි කියල. මම කණගාටුවෙන් ප්‍රකාශ කරන්න කැමතියි මුලින්ම අපහාසාත්මක දන්වීම් පත්‍රිකාවක් නිකුත් කලේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි. බලවත් අසාධාරණයක් කලා. බලවත් අපහාසයක් කලා මැතිවරණ ව්‍යාපාරයට. ජනාධිපතිවරණ ලේකම් කාර්යාලය නම්න්මයි මේ පත්‍රිකාව නිකුත් කලේ. මොකක් ද ඒකෙ තිබුණෙ. මාව කාටුන් චිත්‍රයකට දල මගේ මුළු ශරීරය පුරාම මඩ. අපේ ජනාධිපතිතුමා පින්සලයකින් මගේ ඇඟ සුදු හුනු ගානවා. මගේ නම සදහන් කරල තිබුණ. ප්‍රේමදාස කියන නම දල. මොකක් ද මේකෙන් පෙන්නුම් කරන්න වැයම් කරන්නේ. මම දූෂිත පුද්ගලයෙක්. බණ්ඩාරනායක මහත්මිය මට කරපු අපහාසයක් දිවයින පත්‍රයේ ප්‍රසිද්ධ කරල ඒ අනුව මම ඒ ගොල්ලන්ට දම්ම නඩුවක් ලක්ෂ විස්සක් ඉල්ලලා. එයාගේම මල්ලී ගේ දූව ප්‍රසිද්ධ උසාවියේ සමාව ඉල්ලා මගේ අනුකම්පාව ලබා ගෙන ලක්ෂ විස්ස ලක්ෂ දහයට අඩු කරගෙන මට වන්දි ගෙවන බව දන දනමයි මෙවැනි පත්‍රිකා නිකුත් කලේ.

කොළඹ නගරාධිපති සිරිසේන කුරේ මහතාට විරුද්ධව පැමිණිල්ලක් පොලිසියේ සටහන් කෙරුවා බණ්ඩාරනායක මහත්මිය. මහ භයානක අපරාධකාරී චෝදනාවක් තිබුණ යම් යම් අය මරා දමන්න බලාපොරොත්තු

වෙනවයි කියල. සිරිසේන කුරේ මහතා පොලිසියට කිව්වා කරුණාකරලා මේ ගැන පරීක්ෂා කරන්නැයි කියල. තමන් වැරදි කාරයෙක් නම් තමන්ට තඩු දන්නයි කියල. මේක බොරු චෝදනාවක් නම් බොරු කියපු එක්කෙනාට විරුද්ධව ක්‍රියා කරන්නෙයි කියලා. මම අද පත්තරේ දැක්ක උසාවියේ මේ සිද්ධිය රූප පිළිරූප දීල තියෙනවා. පොලිසිය අවසානයේදී වාර්තාව ඉදිරිපත් කරල තියෙනවා. බණ්ඩාරනායක මහත්මිය ඉදිරිපත් කරපු චෝදනාව ඔප්පු කරන්න සාක්ෂි නැතෙයි කියල. ඔය විධියට මැතිවරණ ව්‍යාපාරයක් ආරම්භ කරපුවාම පරදින එක පුදුමයක් නොවෙයි. බලන්න අන්තිමට කොයි තරම් බංකොලොත් භාවයට පත් වුනාද ජනතා විමුක්ති පෙරමුණත් තමාට විරුද්ධව දල තියෙන තහනම ඉවත් කළාය ඒ ගොල්ලො ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ජන්දය දන්න දෙනවයි කියල බොරු පත්‍රිකාවක් මුද්‍රණය කරල බෙද හරින්නත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සිද්ධ වුනා.

කොහොමද එවැනි පක්ෂයක් පාර්ලිමේන්තු මැතිවරණයෙන් දිනන්නේ කියල මම අහන්න කැමතියි. මගෙන් ඈහැව්ව කොහොම ද දුගී දුප්පත්කම නැති කරන්න සල්ලි හොයන්නෙ කියල. සිංහල අවුරුද්දට මගේ පොරොන්දුව ඉෂ්ට කරන කොට මම කැමතියි බණ්ඩාරනායක මහත්මියට ආරාධනය කරන්න ඒ පලවෙනි ගෙවීම ඇගේ අතින්ම දුප්පත් පවුලකට දෙන්නෙයි කියල. ඒ සල්ලි මිටිය උස්සාගෙන ඒමට කෙනෙක් වුවමනා නම් රොනී ද මෙල් ඒකට පත්කර ගන්නා හැටියට මම ඉල්ලා සිටිනව. මීළඟ විසිහතර මාසය මගේ රජය ක්‍රියා කරන්නේ දුගී දුප්පත්කම පරාජය කරන්න බව මම තමුන්නාන්සේලාට කියන්න කැමතියි. රැකී රක්ෂා නැතිව බලාපොරොත්තුවක් නැතිව ජීවත් වන තරුණ පෙළට ජීවන උපායක් සාද දෙන්නට ඊළඟ විසිහතර මාසය මම ගත කරනවා. දුක් ගිනි නිමා කරන්න මේ විසිහතර මාසයේ මම බලාපොරොත්තු වෙනවා. බලන්න මේ ජනාධිපතිවරණයේ ප්‍රතිඵලත් සමඟම විශාල කැලඹිල්ලක් රට පුරාම ගමන් කරල තියෙනවා. නමුත් තවමත් ඇතැම් පලාත්වල භීෂණය රජ කරවන්නට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගැත්තෝ උත්සාහ කරන බව මම හොදින් ම දන්නවා. මම ඒ ගොල්ලන්ට කියන්න කැමතියි අපේ ගුණාත්මක භාවය දුර්වලකමක් හැටියට බාර නොගන්නයි කියලා. මම දන්නවා ඒ ගොල්ලො වෙනත් පක්ෂවල බෝඩ් ලෑලි ඉස්සරහට දගෙන මේ භීෂණය ඇති කරන්න ක්‍රියා කරන බව. මම විශ්වාස කරනවා දැන්වත් එවැනි අදහස් ඉවත් කර ගනී කියල. ජන සම්මත වාදයත් සමග සෙල්ලම් කලා ඇති කියල. ජනසම්මත වාදය ඔය අධර්මිෂ්ඨකම් නොඉවසන බව මට ඒකාන්තයෙන් ම විශ්වාසයි.

## වටිනාම ආභරණය නිහතමානිකම

අපි හැමදෙනාටම උසස් වගකීමක් පැවරිලා තිබෙනවා. වගකීමක් ලැබුනම එය අපි ආදරයෙන් ආශාවෙන් පිළිගන්නවා. බොහොම නිහතමානීව පිළිගන්නවා. පල බර ගසක අතු පහළට නැමෙනවා වාගේ බලය ලැබෙන්ට ලැබෙන්ට අපි වඩා වඩාත් නිහතමානී වෙන්න ඕනෑ. අපට ලැබෙන පදවි නානාන්තර ආභරණ නොව අවස්ථාවන් හැටියට අපි කල්පනා කරන්න ඕන. මොහොතකට කල්පනා කර බලන්න සහෝදර සහෝදරියනි නැති බැරි අසරණ ජනතාව ඇති හැකි ජනතාවක් හැටියට ඉන්නවා දකින්නට ලැබීම තරම් තවත් වරප්‍රසාදයක් මේ ජීවිතයේ දී අත්පත් කර ගන්න පුළුවන් ද? අපි අනික් අයගෙන් අවිහිංසාවක් බලාපොරොත්තු වෙනවා නම් අපි ප්‍රථමයෙන් ම අවිහිංසාවාදී වෙන්න ඕන. අපට පෙනෙනවා කළු වලාවක් අතරින් රිදී රේඛාවක් උදාවෙන බව. අපට ඒ ආදර්ශය උතුරින් හා නැගෙනහිරින් ලැබෙනවා. අපේ රටෙන් වෙන් වෙච්ච වෙනම රාජ්‍ය පිහිටුවන්ට ඡන්ද බලය ගැන විශ්වාසයක් නැතිවත් ඡන්ද බලය ගැන විශ්වාස ඇතිව වැඩ කරන්නට පෙලඹුණු, පෙළඹුන කොටස්වලට ඒ ගමන් මාර්ගය අතහරින්න වෙනවා. මේ ජනාධිපතිවරණය වෙනුවෙන් මම උතුරටත් නැගෙනහිරටත් ගියා. අපි පිළිගත් ආකාරය ගැන මට තමුන්නාන්සේලාට කියන්න තියෙන්නේ මම විමතියට පත් වූ බවයි. පසුගිය අවුරුදු හත අට තුළ මොන විධියේ පීඩාවකට පත් වෙච්ච ප්‍රදේශයක් ද උතුරත් නැගෙනහිරත්. මේ උතුරේ ජීවත්වන ද්‍රවිඩ ජනතාව, මුස්ලිම් ජනතාව, සිංහල ජනතාව මොන තරම් හිරිහැරවලට මුහුණ පෑවද. මේ ඛේදජනක සිද්ධීන් සිද්ධ වුනේ අපේ පාලනය යටතේ. ඒ පාලනයට හවුල් වුන පුද්ගලයෙක් හැටියට මම ඒ ප්‍රදේශවලට ගියාම; මන්නාරම, වවුනියාව, මුලතිව්, යාපනය, ත්‍රිකුණාමලය, කින්යා, මඩකලපුව, කල්කුඩාව, එරාවූර්, සමන්තුරේ හා පොතුවිල්වැනි ප්‍රදේශවලට ගියා. ඒ හැමතැනකම අපට ලැබුණේ ආදරයක්, සැලකිල්ලක්, ගෞරවයක් බව මම තමුන්ලාට ප්‍රකාශ කරන්න කැමතියි. ඒ උපහාරයට මම කැමතියි. ලංකාවේ අතිකුත් පළාත්වල දී ලැබූ උපහාරවලට මගේ ගෞරවය පිරිනමමින් ඒ උතුරෙන් නැගෙනහිරෙන් ඒ ජනතාවටත් තමුන්නාන්සේලාගේ උපහාරය මේ අවස්ථාවේ දී පිරිනමන්න. අපේ ගමන් මාර්ගය ඉතා පැහැදිලිය. අපේ අධිෂ්ඨානය අපේ ජනතාව අවබෝධ කරගෙන තිබෙනවා. මේ ගමන් මඟ අධිෂ්ඨානපූර්වකව ගියොත් ඉදිරි අවුරුදු හය අපේ රට ලෝකයේ ම ආදර්ශමත් රටක් හැටියට ප්‍රසිද්ධ වන බවට කිසිම සැකයක් නැහැ.

අපේ ශ්‍රීමත් ජනාධිපතිතුමාටත් එතුමාට පෙර අපේ නායකත්වය දැරූ ඒ ශ්‍රේෂ්ඨ උතුමන්ලාටත් ඩී. ඇස්. සේනානායක මැතිතුමාගෙන් ආරම්භ වූ ඩඩ්ලි සේනානායක මැතිතුමා, ශ්‍රීමත් ජෝන් කොතලාවල මැතිතුමා ආදී වශයෙන්

ඉදිරියට ගමන් කළ අපට ඉදිරිමඟ පෙන්වූ ඒ නායකත්වයට මීට වඩා උපහාරයක් අපට කරන්නට නැහැ. ඒක තමයි උසස්ම උපහාරය. තමුන්නාන්සේලා හැමදෙනාටම නැවත වාරයක් මා කෙරෙහි විශ්වාසය තැබීම, මට උදව් ආධාර කිරීම ගැන තමුන්නාන්සේලා, මාව තිබ්බ මහ ගෙතියන්නට ක්‍රියා කිරීම ගැන මගේ හද බැඳි ගෞරවය පිරිනමමින් මේ කතාව අවසන් කරනවා.

26 AUG 2023
පුස්තකාලය

මුද්‍රණය : රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව




ප්‍රකාශනය

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

ප්‍රවෘත්ති අමාත්‍යාංශය

කොළඹ